සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ......................................................... කාලය: පැය 02 යි.

### I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

---

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ,
(1) ගාමිණී දිසානායක මැතිතුමාට ය (2) ලලිත් ඇතුළත් මුදලි මැතිතුමාට ය
(3) ඩී.එස්.සේනානායක මැතිතුමාට ය (4) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මැතිතුමාට ය

(02) පොදු සේවාවන් පවත්වා ගෙන යාමේ අරමුණ දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) ජනතාවට අවශ්‍ය සියලුම සේවාවන් නොමිලේ ලබා දීම
(2) ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය ඇති කිරීම
(3) පෞද්ගලික අංශය සේවා සැපයීමට දායක කර ගැනීම
(4) හදිසි විපත් අවස්ථා සඳහා ජනතාවට සහාය ලබාදීම

(03) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොවන්නේ,
(1) නායකත්වයට ගරු කිරීම (2) සහයෝගයෙන් කටයුතු කිරීම
(3) උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විඳීම (4)නායකත්වයේ කැමැත්ත මත පමණක් තීරණ ගැනීම

(04) ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු තුළ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
(1) තමා කැපී පෙනීමට උත්සහ දැරීම (2) ඒකමතිකව තීරණවලට එළඹීම
(3) ජනතා අදහස් පිළිගැනීම හා ගරු කිරීම (4) පොදු ජනතා අදහස් පිළි නොගැනීම

(05) ලොව ප්‍රබලතම ජන සමාජයක් ජීවත්වන ඉන්දියාව තුළ භාවිත වන භාෂා පමණක් ඇතුලත් පිළිතුර කුමක් ද?
(1) මරාටි, උර්දු, තෙලිඟු (2) සැමෝන්, කැමරු, කැරෝකි
(3) ඉංග්‍රීසි, සංස්කෘත, රොමාන්ෂ් (4) ප්‍රංශ, ගුජරාටි, හවායියන්

(06) ශ්‍රමයේ ඵලදායිතාවය ඇතිවන්නේ,
(1) අධ්‍යාපනයෙන් ලැබෙන දැනුම අනුවය
(2) ශ්‍රමය සඳහා ලැබෙන ප්‍රතිලාභය අනුවය
(3) ශ්‍රමිකයාගේ දැනුම, කුසලතා හා ආකල්ප මට්ටම අනුවය
(4) ශ්‍රමිකයන් සපයන රැකියාවේ ස්වභාවය අනුවය

(07) පිත්තල භාණ්ඩ හා මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා සුවිශේෂී වූ ප්‍රදේශ පිළිවෙලින් ඇතුලත් පිළිතුර තෝරන්න
(1) අම්බලන්ගොඩ හා මොළගොඩ (2) පිළිමතලාව හා මොළගොඩ
(3) වේවැල්දෙණිය හා අම්පාර (4) අම්බලන්ගොඩ හා පිළිමතලාව

(08) තමන් සම්පත් භුක්ති විඳින අතරම එය අනාගත පරපුරටද ඉතිරි කළ යුතු බව පැවසෙන ''යුතුකමේ අගය'' නම් කවි පෙළ රචනා කළේ,

(1) චීන ජාතික පාහියන් හිමි (2) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි

(3) වීදාගම මෛත්‍රීය හිමි (4) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

(09) ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසියක් වන්නේ,

(1) ජන කොටස් අතර සමගිය තහවුරු වීම ය.

(2) එකිනෙකා අතර ගැටුම් ඇතිවීම වර්ධනය වීම ය.

(3) බහු සංස්කෘතික සමාජයන් ගොඩ නැගීමය.

(4) තම සංස්කෘතික අනන්‍යතාව සඳහා පමණක් කටයුතු කල හැකිවීම.

(10) මාර්ග අනතුරු සිදුවීමට බලපාන මූලික හේතුවක් වන්නේ,

(1) මහ මග දකුණු පසින් ගමන් කිරීම ය. (2) වැඩිපුර මගීන් රැගෙන යාම ය.

(3) මාර්ග නීති පිළිබඳ අවබෝධයෙන් යුතු වීම ය. (4) රියදුරන් අතින් සිදුවන වැරදි ය.

- අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් '''' ලකුණ ද වැරදි නම් '''' ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ ලකුණු කරන්න.

(11) තැපැල් හා විදුලි පණිවිඩ සේවාව ශ්‍රී ලංකාවේ ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී ය. ( )

(12) පොදු සේවා ජනතාවට ලබාදීම සඳහා රජය ජනතාවගෙන් ලබා ගන්නා බදු මුදල් යොදා ගනියි. ( )

(13) ''ජෙරී ග්‍රෙගරී'' සේවාදායකයාගෙන් බලාපොරොත්තු වන නිපුණතා නවයක් ඉදිරිපත් කර ඇත. ( )

(14) අයහපත් චිත්තවේග සුබවාදීව හසුරුවා නොගැනීමෙන් තමාට මෙන්ම සමාජයට ද හානි සිදු වේ. ( )

(15) ජපන් වැසියන් පරිසර හිතකාමී වාහනයක් ලෙස මෝටර් රථය බහුලව භාවිත කරයි. ( )

- 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන් මතට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර ලියා සම්පූර්ණ කරන්න.

(16) හදිසි අවස්ථාවක දී ................................................................ ආශ්‍රිත පැමිණිලි 1991 දුරකතන අංකයට දැනුම් දිය හැකිය.

(17) අනාගත පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීමට බාධා නොවන අයුරින් වර්තමාන පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීම ........................................ සංවර්ධනයයි.

(18) බහු සංස්කෘතික රටක් ලෙස කටයු කිරීමේදී ඇමරිකා එක්සත් ජනපදය .................................. භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගෙන ඇත.

(19) ශ්‍රී ලංකාවේ මාර්තු, අප්‍රේල්, ඔක්තෝම්බර්, නොවැම්බර් යන මාසවල ........................................... ක්‍රියාවලිය නිසා අකුණු කුණාටු ඇති වේ.

(20) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය අනුව වයස ................................ අඩු සෑම මනුෂ්‍යයකු ම ළමයෙකු සේ සැලකේ.

(ලකුණු 2×20=40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

කෙටි පිළිතුරු ලියන්න.

(01)

(1) පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න.

(2) ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාල වන ගුණාංග දෙකක් ලියන්න.

(3) කොවිඩ් - 19 වෛරසයෙන් වැළකීම සඳහා මහජනතාව විසින් අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(4) ශ්‍රී ලංකාවේ ආගම පදනම් කරගෙන ගොඩනැගී ඇති සංස්කෘතීන් දෙකක් නම් කරන්න.

(5) වැඩ ලෝකයේ පවතින රැකියා බේදිය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් සඳහන් කරන්න.

(6) නියඟයෙන් ආරක්ෂා වීම සඳහා භාවිත කල හැකි ජල සංරක්ෂක ක්‍රම දෙකක් ලියන්න.

(ලකුණු 2×6=12)

(02) ''සමාජයේ යහ පැවැත්මට අයිතිවාසිකම් භුක්ති විඳින අතරම යුතුකම් ද ඉටු කළ යුතු වේ''.

(1) ළමා අයිතිවාසිකම් වල දක්වා ඇති ප්‍රධාන තේමා තුනක් ලියන්න. (ලකුණු 3)

(2) ප්‍රාදේශීය මට්ටමින් දරුවන් හා පවුල් සඳහා සේවා සපයන රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

(3) (a) පාසල් සිසුවකු ලෙස ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 5)

(b) ඉන් එක් අයිතිවාසිකමක් භුක්ති විඳීමේ දී ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් කෙටියෙන් ලියන්න.

(03) ''ජනතා අවශ්‍යතා සංකීර්ණ වීම සමඟ පොදු සේවා සැපයීම වර්ධනය කිරීම ද අවශ්‍ය වේ''.

(1) පොදු සේවාවල දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)

(2) පොදු සේවාවක් වන අධ්‍යාපනය මගින් ඉටු කරන කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(3) (a) අධ්‍යාපනය හැර ඔබ භුක්ති විඳින වෙනත් පොදු සේවාවන් තුනක් නම් කරන්න.

(b) ඉන් එක් සේවාවක් භුක්ති විඳීමේ දී පුරවැසියෙකු විසින් ඉටුකල යුතු යුතුකම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(04) ''වර්තමාන ලෝකයේ බොහෝ රටවල් බහු සංස්කෘතික සමාජයන්ය''.

(1) බහු සංස්කෘතික සමාජයන් පවතින රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(2) බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)

(3) බහු සංස්කෘතික ජන සමාජයක ජීවත්වන පුරවැසියෙකු ලෙස ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(05) ''වර්තමානයේ මිනිසාට විවිධ විපත් හා අනතුරුවලට මුහුණ පෑමට සිදුව ඇත''

(1) ස්වාභාවික විපත් ඇතිවීමට බලපාන පෘතුවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලීන් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(2) ගං වතුර ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 4)

(3) ස්වාභාවික විපත් අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පහක් සඳහන් කරන්න. (ලකුණු 5)

(06) ''වැඩ ලෝකය තුල පවතින සෑම ඊකියාවක්ම සමාජයේ පැවැත්මට හේතු වේ''.

(1) යහපත් ශ්‍රමිකයෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් නම් කරන්න. (ලකුණු 3)

(2) ශ්‍රමය බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න. (ලකුණු 4)

(3) ශ්‍රමාභිමානයෙන් කටයුතු කිරීම නිසා,

a. සේවාදායකයාට අත්වන ප්‍රයෝජන දෙකක් ද?

b. සේවාලාභියාට අත්වන ප්‍රයෝජන තුනක් ද සඳහන් කරන්න. (ලකුණු 5)

(07) ''ශ්‍රී ලංකාවේ වර්තමානයේදී මාර්ග අනතුරු බහුලව සිදුවන බව හඳුනාගෙන ඇත''

(1) මාර්ග අනතුරු සඳහා බලපාන පදිකයින් විසින් සිදුකරන වැරදි තුනක් ලියන්න (ලකුණු 3)

(2) මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා රියදුරෙකුට පැවරෙන වගකීම් දෙකක් ලියන්න (ලකුණු 4)

(3) මහා මාර්ගයේ අනතුරක් සිදු වූ අවස්ථාවක නීතිගරුක පුරවැසියෙකු ලෙස ක්‍රියා කල යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 8 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු

I කොටස

| | | | |
|---|---|---|---|
| (01) 4 | (06) 3 | (11) | (16) පරිසරය හා ස්වාභාවික සම්පත් |
| (02) 2 | (07) 2 | (12) | (17) තිරසර |
| (03) 4 | (08) 2 | (13) | (18) ඉංග්‍රීසි |
| (04) 3 | (09) 1 | (14) | (19) සංවහන |
| (05) 1 | (10) 4 | (15) | (20) අවුරුදු 18 |

(ලකුණු 2×20=40)

II කොටස

(01) (1) පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, භූ විද්‍යා හා පතල් කාර්යාංශය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

(2) අන් අයගේ මතයට ගරු කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම, විනිවිදභාවයෙන් කටයුතු කිරීම, විවිධ මත ඉවසීම, සමානාත්මතාව ගරු කිරීම ආදී

(3) මුඛ ආවරණ පැළඳීම, නිතර දෑත් පිරිසිදු කිරීම, සෞඛ්‍ය උපදෙස් හා නීති රීති පිළිපැදීම ආදිය

(4) බෞද්ධ සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය

(5) රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය , පෞද්ගලික අංශය , ස්වයං රැකියා

(6) වන ආවරණ ඉවත් නොකිරීම, ගස්වැල් සිටුවීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, වන වගාව, වැසි ජල ටැංකි භාවිතය (ලකුණු 2×6=12)

(02) (1) ආරක්ෂාවට ඇති අයිතිය, සහභාගීත්වයට ඇති අයිතිය, සංවර්ධනයට ඇති අයිතිය, පැවැත්මට ඇති අයිතිය(මින් දෙකක්)

(2) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී, මුල් ළමාවිය සංවර්ධන නිලධාරී, සමාජ සේවා නිලධාරී ආදී

(3) (a) අධ්‍යාපනය ලැබීම, සෞඛ්‍ය පහසුකම් ලැබීම, නිසි රැකවරණය ලැබීම, මිතුරු සබඳතා පැවැත්වීම

(b) සිසු පිළිතුරු අනුව යුතුකම් සඳහා ලකුණු ලබා දෙන්න.

(03) (1) සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගතහැකි වීම, මහජන සුභ සිද්ධිය අරමුණු කරගෙන පවත්වා ගෙනයාම, පුද්ගල සංවර්ධනය තුලින් සමාජ සංවර්ධනයට දායක වීම, පවත්වා ගෙන යාමට හා ආරක්ෂා කිරීමට නීති පද්ධතියක් පැවතීම ආදිය

(2) නව දැනුම ලබාදීම, සමාජානුයෝජනය කිරීම, යහපත් පුරවැසියන් බිහි කිරීම, ජාතික සමගිය පෝෂණය කිරීම

(3) (a) විදුලිය , සෞඛ්‍ය , ප්‍රවාහනය.... ආදිය

(b) සිසුන් ලියා ඇති සේවාවට අදාල යුතුකම් දෙකක්වත් දක්වා තිබීම (9 ශ්‍රේණිය පෙළපොත 30,32 පිටු)

(04) (1) ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, මහා බ්‍රිතාන්‍ය

(2) විවිධ ජන වර්ග ජීවත් වීම, විවිධ ආගම් පැවතීම, විවිධ භාෂා කතා කරන ජනතාව ජීවත්වීම, විවිධ සිරිත් විරිත්, සංස්කෘතික උරුම පැවතීම ආදිය

(3) අන් සංස්කෘතීන්ට ගරු කිරීම, සෑම ජන වර්ගයකම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, අන් අයගේ මතවාද, අදහස් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය පිළිගැනීම හා ඒවාට ගරු කිරීම ආදිය

(05) (1) සුනාමි , භූමිකම්පා , භූ චලන

(2) වනාන්තර විනාශ කිරීම, වගුරු බිම් ගොඩ කිරීම, පතල් කැණීම, ගංගාවල වැලි ගොඩ දැමීම, ගං ඉවුරුවල අනවශ්‍ය ඉදිකිරීම්, දිරාපත් නොවන අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම

(3) කැලෑ ගිනි නොතැබීම, කඩොලාන ආරක්ෂා කිරීම, වෙරළ තීරයේ වැලි වැටි සුරැකීම, කඩොලාන ශාක ආරක්ෂා කිරීම, වනාන්තර විනාශ නොකිරීම, අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීමෙන් වැළකීම, කොරල්පර කැඩීමෙන් වැළකීම, වෙරළබඩ හා කඳුකර ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් නොකිරීම ආදිය

(06) (1) සංවේදී බව, සමාජශීලි බව, වෙලාවට වැඩ කිරීම, නිර්මාණාත්මක බව, කාර්යක්ෂම බව, පිළිවෙලට වැඩ කිරීම

(2) කායික ශ්‍රමය , මානසික ශ්‍රමය

(3) සේවාදායකයාට - රැකියාව පිළිබඳ අභිමානයක් ඇතිවීම, සේවාව පිළිබඳ තෘප්තිමත් බව හා සතුටක් ඇතිවීම, ආයතනය කෙරෙහි ඇල්මක් ඇතිවීම, කාර්යය ඉහළින්ම ඉටු කිරීමට පෙළඹීම

සේවාලාභියාට - අවශ්‍යතා පහසුවෙන් ඉටු කරගත හැකිවීම, සමාජීය කාර්යක්ෂමතාව ඇතිවීම, චිත්තවේග සමබරතාවය ඇතිවීම, ආයතනය කෙරෙහි හිතවත්බවක් ඇතිවීම, විශ්වාසනීයත්වය ගොඩ නැගීම

(07) (1) මාර්ග සංඥා හා නීති පිළිබඳ සැලකිලිමත් නොවීම, දකුණු පසින් ගමන් නොකිරීම, ජංගම දුරකථන භාවිත කරමින් ගමන් කිරීම, පදික මාරු භාවිත නොකිරීම, කණ්ඩායම් වශයෙන් ගමන් කිරීම ආදී

(2) මාර්ග නීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, මාර්ග සංඥා පිළිපැදීම, බීමත්ව රිය පැදවීමෙන් වැළකීම, අයහපත් කාලගුණ තත්වවලදී ප්‍රවේශමෙන් රිය පැදවීම, ආරක්ෂිත පටි පැළඳීම ආදිය

(3) ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවීමට ඇති ඉඩකඩ වැළැක්වීම, ඉක්මනින්ම තුවාල ලත් අය රෝහල වෙත ගෙනයාම, පොලීසිය දැනුම්වත් කිරීම, විපතට පත් අයගේ මුදල්,භාණ්ඩ ආරක්ෂක අංශ වෙත හෝ හිමිකරුට ලබාදීමට කටයුතු කිරීම ආදිය

ලකුණු I කොටස =40

II කොටස =12×6=60

මුළු ලකුණු 100